**ශීර්ෂය 195 - සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත්කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් නොවන ලැබීම් යටතේ රු.8,698,521 ක් දක්වා තිබුණත් විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ අනුව වෙනත් ලැබීම් රු.7,740,738ක් වී තිබුණි. ඒ අනුව රු.957,783ක් වැඩියෙන් දක්වා තිබුණි | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශන සංඛ්‍යා පදනම්කර ගත යුතුවීම. | අමාත්‍යාංශයට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය පවරා ගැනීමට අදාල මුදල වන රු.959,949.50ක් වෙනත් ලැබීම් යටතේ ගණනය කර ඇති අතර ජර්නල් සටහන් මගින් රු.2.166.77ක මුදල ගැලපීමෙන් අනතුරුව වෙනත් ලැබීම් රු.8,698,521ක මුදල නිවැරදිය. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.4,154,406ක් දක්වා තිබුණත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එය රු.5,577,886ක් වී තිබුණි. ඒ අනුව රු.1,423,480ක වෙනසක් අනාවරණය විය. | -එම- | අමාත්‍යාංශයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ 195011 අත්තිකාරම් ගිණුමේ ලැබීම් රු.4,154,406 ක මුදල ගිණුම්ගත කර තිබූ අතර, අනෙකුත් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ යටතේ බැර කර තිබූ රු.1,423,480 ක මුදල ගැලපුම් ගිණුමේ සටහන් මගින් දක්වා ඇත. තවද, එම මුදල රු.1,123,480 ක් නොව 1,423,480 ක් වේ. |
| (ඇ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ගෙවීම් වශයෙන් රු.13,740,933ක් දක්වා තිබුණත් විගණනයට ඉදිරිපත්කළ මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.14,706,838ක් වී තිබුණි. ඒ අනුව රු.965,905ක වෙනසක් අනාවරණය විය. | -එම- | එම මුදල අක්මුදල් ගැලපුම් ගිණුමේ සටහනක් මගින් දක්වා ඇත. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.1,607,150,989ක් දක්වා තිබුණත්, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එහි වටිනාකම රු.1,609,728,543ක් ලෙස රු.2,577,554ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවීම. | කාර්තුමය සීමාවන් මත සමහර වැය විෂයන්ට වියදම් ගිණුම්ගත කිරීමට නොහැකි වීම නිසා වෙනත් වැය විෂයයන්ට හරකර පසුව ඒවා නිවැරදි කිරීම සඳහා එම ජර්නල් සටහන් යොදා ඇත. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකළ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ගෙවීම් රු.303,385ක් සටහන්කර නොතිබුණි. | - එම - | |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වල වැයකළ මුදල් ප්‍රවාහය යටතේ රු.1,606,562,438ක් දක්වා තිබුණත්, විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.1,599,443,544 ක් වී තිබුණි. ඒ අනුව රු.7,118,894ක් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | |
| (ඈ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයේ අත්තිකාරම් ලැබීම් වශයෙන් රු.5,114,355ක් හා අත්තිකාරම් ගෙවීම් රු.14,706,838ක් දක්වා නොතිබුණි. | - එම - | |

| | | |
|---|---|---|
| (ඉ) | අමාත්‍යාංශය මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී නොතිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැයකල මුදල් ප්‍රවාහයේ රු.199,420 ක් දක්වා තිබුණි. | - එම - |

### 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව නිශ්චිත කාල සීමාවක් තුළදී විගණන විමසුම්වලට පිළිතුරුදීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | XV වැනි පරිච්ඡේදයේ 11.1 වගන්තිය හා 1990 ජූලි 27 දිනැති අංක එෆ්/පී /06/140 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | 520,000 | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ලිපිය මගින් අනුමත නොකළ තනතුරු හිමි නිලධාරීන් 04 දෙනෙකුට විදේශ | විදේශ ගමන් යෑමට ගුවන් ටිකට්පත් මිලදී ගැනීමේදී භාණ්ඩාගාර නියෝජ්‍ය | එම සාකච්ඡාවන් සඳහා සහභාගීවූ නිලධාරීන් එවකට ස්ථාපනය කිරීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ගමන් යාම සඳහා ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට්පත් ලබාගැනීම සඳහා රු.520,000 ක් වැයකර තිබුණි. | ලේකම්ගේ ලිපියෙන් අනුමතකළ නිලධාරින්ට පමණක් ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා වියදම් කළ යුතු වීම. | යෝජිතව තිබූ අන්තර්ජාතික වෙළදාම පිළිබඳ ඒජන්සියට අයත් බවත් ඔවුන්ට කිසිදු ගෙවීමක් සිදු නොකරන ලද බැවින් ඔවුන්ගේ අත්දැකීම් හා නිපුණතා සැළකිල්ලට ගෙන විදේශගතවීමේදී ව්‍යාපාරික පන්තියේ ගුවන්ටිකට්පත් ලබාදීම පමණක් සිදුකර ඇත. |
| (ii) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**------------------------------** | | | | |
| | මුදල් රෙගුලාසි 104(1), 104(3) හා 104 (4) | ගණනය කර නොතිබුණි. | වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් දින 07 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු මූලික පරීක්ෂණ වාර්තාව හා මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අවසාන පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නියමිත දිනවලදී අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | අදාළ වාර්තා කඩිනමින් අවසන් කරන ලෙසත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන ලෙසත් අදාළ නිලධාරින් දැනුවත්කර ඇත. |
| (iii) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**-------------------------** | | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | | අමාත්‍යාංශයේ වාහන 16ක් සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකළ යුතුය. | දැනට වාහන 05ක ඉන්ධන දහනය පරීක්ෂාකර ඇති අතර අනෙක් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් ඉදිරියේදී සිදුකිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කටයුතු කර ඇත. |
| (iv) **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ** | | | | |
| 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන චක්‍රලේඛය | 266,800 | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙසක් සුභ පැතුම්පත් 3,000 ක් මුද්‍රණයට රු.266,800 ක් වැය කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | විෂයය භාර අමාත්‍යවරුන්ගේ ඉල්ලීම මත සුභපැතුම්පත් මුද්‍රණය කළ බවත්, වියදම් සීමාකිරීමට අදාළ නිලධාරීන් දැනුවත්කර ඇත. |
| (v) **වත්කම් කළමනාකරණ චක්‍රලේඛ** | | | | |
| 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛයේ 02.i ඡේදය | 1,069,330 | අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන් සතු වාහන 4ක් විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණි. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | අදාළ වාහන පවරාගැනීමේ කටයුතු පිළිබඳව සොයාබලා කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස්දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 17 කට සහ මූලධන වැය විෂයයන් 22 කට අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට 11ක සිට සියයට 100ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි . | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | විවිධ හේතු මත එලෙස ප්‍රතිපාදන ඉතිරිවී ඇති අතර රටේ පැවති රජය වෙනස්වීම, උපදේශක ආයතන තෝරාගැනීමේ ප්‍රමාදය, සුදුසුකම් සහිත විශේෂඥයින් ලබාගැනීම ප්‍රමාදවීම වැනි විවිධ හේතූන් මත අපේක්ෂිත |

පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවී ඇත.

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.321,695 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අත්‍යවශ්‍ය හා කල් දැමීමට නොහැකිවූ වියදම් වෙනුවෙන් එලෙස බැරකම්වලට බැඳීමට සිදුවිය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් නොවූ 2018 වර්ෂයට අදාළ බැරකම් වටිනාකම රු.2,053,532 ක් වී තිබුණි. | වර්ෂයට අදාල සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් විය යුතුය. | එම ගෙවීම ප්‍රමාද දෝෂයකින් ඇතුළත් කිරීමට නොහැකිවී ඇති බවත්ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවන පරිදි කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |

**2.3 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, නිලධාරීන් 07 දෙනෙකු වෙත අවස්ථා 10 කදී නිකුත් කළ රු.287,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 25 ක සිට දින 67 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | මුදල් රෙගුලාසි 372(5) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අතුරු අග්‍රිම පියවීම විවිධ හේතූන්මත ප්‍රමාදවී ඇති බවත් ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙළඳ පහසුකම් යටතේ ගිවිසුම් 07ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 70ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 33.92ක් පමණක් වැය කර තිබුණි. එයින් ගිවිසුම් 05කට අදාළව අත්කරගත් ප්‍රගතිය සියයට 5ක සිට සියයට 10ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. තවත් ගිවිසුම් 03ක් 2019 හා 2020 වර්ෂ සඳහා කල්තබා තිබුණි. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර අපේක්ෂිත කාර්යභාරයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | අරමුණු, පොදු නිර්වචන, ආරවුල් බේරුම්කරණය, තීරුබදු රේඛා, වැනි තාක්ෂණික කරුණු පිළිබඳව එකඟතාවයකට පැමිණීම ප්‍රමාද වීම හා වෙනත් විවිධ හේතූන් මත සමහර ගිවිසුම් 2020 වර්ෂය දක්වා කල්තබා තිබුණි. |
| (ආ) | මිල්ලනිය කාර්මික කළාපයේ රෝජනා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීමේ (Implementing/Coordinating the project on Rojana Industrial Park in Millaniya) නම් ක්‍රියාකාරකම ඉටුකිරීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 2,900ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 949ක් ඒ සඳහා වැයකර තිබුණි. 2018 වර්ෂයේදී ඉටුකර ගැනීමට සැලැසුම් කර තිබුණු ඉඩම් අත්පත් කර ගැනීම, පරිසර බලපෑම් ඇගයීම, පවුල් නැවත පදිංචි කිරීම, ජලය, විදුලිය හා ප්‍රවේශ මාර්ග සැපයීම යන කටයුතුවලින් සියයට 20ක පමණ භෞතික ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. | සැලැසුම් කල පරිදි ක්‍රියාකාරකම් වලින් ප්‍රගතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම මත සේවා සපයන ආයතන වෙත මුදල් නිදහස් කිරීමේදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. |
| (ඇ) | බිංගිරිය සහ වැලිගම කාර්මික කළාප ස්ථාපිත කිරීමේ (Establish Industrial Zone in Bingiriya and Weligama) ව්‍යාපෘති සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 154.53ක් වැයකර තිබුණු අතර | සැලැසුම් කළ ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත ප්‍රගතිය ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම මත සේවා සපයන ආයතන වෙත මුදල් නිදහස් කිරීමේදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| | අතර, භෞතික ප්‍රගතිය සියයට 40ක් වී තිබුණි. | | |
| (ඈ) | බෝට්ටු සහ නැව් ඉදිකිරීම වෙනුවෙන් නිර්මිත කළාපය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 100ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය තුළ රු.මිලියන 8.107ක් පමණක් වැයකර තිබුණු අතර, සියයට 45ක භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබුණි. | සැලසුම් කළ ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත ප්‍රගතිය ලගාකර ගැනීමට කටයුතුකළ යුතු වීම. | 2018 වර්ෂයේ අවසාන කාලයේ රජයේ ඇතිවූ වෙනස්කම් මත වැඩසටහන් යම්තාක් දුරකට මන්දගාමිවූ බවත්, 2019 වර්ෂයේ පළමු කාර්තුව තුළ මෙම වැඩසටහන්වල ප්‍රගතිය ඉහළ මට්ටමකට ගැනීමට කටයුතුකර ඇත. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් 2019 මැයි 31 දින වන විටත් සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත යැවීමට කටයුතු කරමින් සිටී. |

## 3.3 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා සකස් කරනලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දක්වා නොතිබුණි.ඒ අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහිවර්ෂය සඳහාවූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දැක්විය යුතු වීම. | 2019 වර්ෂය සඳහාවූ ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කිරීමට කටයුතු කරමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රධාන කාර්යයක් වූ වෙළඳ ගිවිසුම්වලට අදාල සාකච්ඡා සහ වැඩමුළු සඳහා ස්ථාන හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම තුළින් සැලැසුම්කර නොතිබුණි. | වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත සියළු ප්‍රසම්පාදනයන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් කළයුතු වීම. | සාකච්ඡා සහ වැඩමුළු සඳහා ස්ථාන හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් පහත පරිදි බැහැරවීම් සිදු වී තිබුණි. | | |
| | (i) මාර්ගෝපදේශ 5.3 ප්‍රකාරව වටිනාකම රු.759,820 ක ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සම්මත ලංසු කැඳවීමේ ලියවිලි භාවිතකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතුකළ යුතුය. | ඉදිරියේදී සිදුකරන ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සම්මත ලංසු කැඳවීමේ ලේඛන භාවිතකිරීමට සටහන් කරගෙන තිබුණි |
| | (ii) මාර්ගෝපදේශ 5.6.1 (අ),(ඇ) හා (ඇ) ප්‍රකාරව පරිගණකයක් සඳහා මිල ගණන් කැඳවීමේදී වෙළඳනාමය සඳහන් කර තිබුණු අතර,එසේ සඳහන් කිරීමෙන් පසුව "හෝ ඊට සමාන භාණ්ඩයක් " යන වචන යොදා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී සිදුකරන ප්‍රසම්පාදන කාර්යයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| | (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3.1 (අ( ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදනයට අදාළව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතුකළ යුතුය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය සතු වාහනයක් වෙනත් අමාත්‍යාංශයක් වෙත මුදාහැර තිබුණි. | වාහන මුදා හැරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. | එම වාහනය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂයේ අමාත්‍ය උපදේශකවරුන් දෙදෙනෙකු වෙනුවෙන් පිළිවෙළින් රු.මිලියන 4.19 ක් හා රු.මිලියන 1.09 ක් වැය කර තිබුණද, එම නිලධාරීන් විසින් ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තනතුරට අදාලව සිදුකළ යුතු රාජකාරී හා වගකීම් ඉටුකිරීම සඳහා සේවා කොන්දේසි ඇතුළත් විස්තරයක් (Terms of Reference) සකස් කර තිබුණද, එහි විධිමත් භාවයක් ඇති කිරීමට කටයුතු කළ යුතුව ඇත. | පත්වීමට අදාළ පසුබිම, විශේෂඥ දැනුම හා අත්දැකීම් මත පවරා ඇති කාර්ය භාරය හා වගකීම අමාත්‍ය මණ්ඩලයේ සංදේශයේ දක්වා තිබුණු අතර, සේවා කොන්දේසි ඇතුළත් විස්තරයක් දැනට සකස්කිරීමට කටයුතු කර තිබුණි. |
| (ආ) | විදේශ වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් තිදෙනෙකුගේ ආසන අවසන් මොහොතේ වෙන් කිරීම හේතුවෙන් ගුවන් ටිකට්පත් ලබා ගැනීම සඳහා රු.77,500 ක වැඩිපුර ගාස්තුවක් ගෙවීමට සිදු වී තිබුණි. | සැලැසුම් සහගතව විදේශ ගමන් සංවිධානය කළ යුතු වීම. | ටිකට් පත් වෙන් කිරීමේදී ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති පුරප්පාඩු 76 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | අදාළ පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර, නැවත සිහිකැඳවීම් යොමුකර නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට කටයුතු කරනු ලබයි. |
| (ආ) | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ 296 දෙනෙකු අතරින් වර්ෂය තුළ 32 දෙදෙනෙකුට පමණක් පුහුණු අවස්ථා ලබාදී තිබුණි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 6 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අතුරින් 161 ක් දෙනෙකු අපනයන සංවර්ධන මණ්ඩලයේ රාජකාරි කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරනු ලබන බවත් ඔවුන් විවිධ අවස්ථාවන්හීදී අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහාද සහභාගි කරවා ගෙන ඇත. |